# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/24 – 2010 මාර්තු 03 වැනි බදාදා – 2010.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: ම/ප්‍රාලේ/3/2/2000/194/LA.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාස අංක 07 මාපනාවතුර (මහනුවර නගර සීමාව තුළ) සුළු කොට්ඨාසයේ, අංක 250 පිටකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලේමහයියාව ගමේ පිහිටි ජ්‍යෙ. මිනින්දෝරු අධිකාරි (මහනුවර දිස්ත්‍රික්කය) විසින් පිළියෙල කරන ලද අංක මු. පි. මහ 6068 හා 2010.01.06 දිනැති පිඹුරෙහි සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1036 ක් වූ ගල්කඩුවේගෙදරවත්ත කුඹුර *නොහොත්* පිටකන්දවත්ත වරි. අංක 244 කටුගස්තොට පාර නමැති ඉඩමේ ඉඩම් කැබලි දෙක (02).

**කැබලි අංක 01**

ඉඩමේ නම: ගල්කඩුවේගෙදරවත්ත කුඹුර *නොහොත්* පිටකන්දවත්ත, වරි. අංක 244, කටුගස්තොට පාර; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0421.

**කැබලි අංක 02**

ඉඩමේ නම: ගල්කඩුවේගෙදරවත්ත කුඹුර *නොහොත්* පිටකන්දවත්ත, වරි. අංක 244, කටුගස්තොට පාර; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0615.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 මාර්තු මස 17 වැනි දින ප. ව. 2.00ට මහනුවර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2010 මාර්තු මස 10 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ටී. එම්. එස්. බණ්ඩාර තෙන්නකෝන්,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
මහනුවර සහ ගඟවට කෝරළය.

2010 පෙබරවාරි මස 25 වැනි දින,<br>
මහනුවර සහ ගඟවට කෝරළය<br>
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 642